HIV/AIDS සම්බන්ධයෙන් පුවත් වාර්තා කිරීමේදී බොහෝ මාධ්‍ය සුලභව සිදු කරන වරදක්, Ethics Eye අපි මින් පෙරද කිහිප විටකදීම පාඨක අවධානයට යොමු කර ඇත්තෙමු. එනම්, HIV සහ AIDS අතර වෙනස පටලවා ගනිමින් පුවත් වාර්තා කිරීමයි.

මෙහිදී පළමු කොටම, HIV සහ AIDS අතර වෙනස පැහැදිලි කර ගැනීම වටී.

එච්.අයි.වී. (HIV - Human Immunodeficiency Virus) නොහොත් 'මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය' ආසාදනය වීම නිසා මිනිසුන්ට ඒඩ්ස් (AIDS - Acquired Immune Deficiency Syndrome) තත්වය ඇතිවිය හැක. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, HIV යනු වෛරසය වන අතර, AIDS යනු පෙර කී වෛරසය මඟින් ප්‍රතිශක්තිය දුර්වල කිරීම නිසා ඇති වන තත්වය ලෙසින් හඳුනාගත හැක. එනම්, ඒඩ්ස් ආසාදනය නොවන අතර, ආසාදනය වන්නේ එච්.අයි.වී. වෛරසයයි.

ඒ අනුව, සති අග අරුණ (ඔක්. 23, 2022) සහ දිවයින (ඔක්. 24, 2022) පුවත් වාර්තාවන් හි, HIV වෛරසය සහ AIDS රෝගී තත්වය පටලවා ගනිමින් පුවත් වාර්තා කර තිබෙනු නිරීක්ෂණය කළ හැක.

1) මෙසේ HIV සහ AIDS වරදවා වටහා ගනිමින් පුවත් වාර්තා කිරීම ඔස්සේ, එච්.අයි.වී/ඒඩ්ස් සම්බන්ධයෙන් වැරදි වැටහීම් ඇති නොවන්නේ ද? ඒ ඔස්සේ එච්.අයි.වී/ඒඩ්ස් සම්බන්ධයෙන් සාවද්‍ය මත සමාජගත නොවනු ඇති ද?

2) එය ඇතැම් විටක එච්.අයි.වී/ඒඩ්ස් මර්දනයට පවා බාධාවක් විය නොහැකි ද?

අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ඔබගේ දුරකථනයටම ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙක් වන්න!